# සංක්‍රමණිකයකුගේ සටහන

## ජූලි..........................

මේ රටේ දැන් ඉන්න පුළුවන් දේශප්‍රේමීන් හා දේශ ද්‍රෝහීන් විතරය ....... වෙන කට්ටියට ඉඩක් නැහැ. දේශප්‍රේමය කියන්නේ මව්බිමට ඇති ආදරයනේ. ඒ නිසාම ජූලි මාසේ මව්බිම නැතිනම් මරණය කියපු කට්ටිය ගැන. අපේ සෞඛ්‍ය ඇමති තුමාත් පසුගිය දවසක ඒ ගැන කථා කරලා තිබුනා. එතුමට නම් ඒක මතක් වෙලා තිබුනෙ ඩෙංගු වලට ප්‍රතිකාරයක් ලෙස කියුබාවේ බෙහෙත් ඕන වෙලා තිබුන නිසා. ජූලි කියන්නෙ කියුබාවටත් ශ්‍රී ලංකාවටත් වැදගත් මාසයක්. ඒක මේ කලු ජූලිය නිසා නෙවේ. කියුබන් විප්ලවයේ සංදිස්ථානයක් වන මොන්කාඩා හමුදා බැරැක්කයට 1953 ජූලි මාසේ 26 මිදෙල්ලා චේලා පහරදී ඒ වෙනුවෙන් ගොඩනැගුනු ජූලි 26 ව්‍යාපාරය බිහිවීමයි. ඒක අදටත් සමරන දවසක් කියුබාවේ. අනෙක නම් ලංකාවේ දේශපාලන ඉතිහාසයේ නව පටුනක් පෙරලපු රෝහණ විජේවීර සහෝදරයාගේ උපන් දින සැමරුමත් ජූලි මාසේ 14 ට යෙදිලා තියෙන්නේ. මේවා අප යලි යලිත් ලියන්නේ මේ මිනිස්සු ඔය දැන් අළුතින් බිහිවෙලා ඉන්න දේශප්‍රේමී කට්ටියට වඩා හොඳ දේශප්‍රේමීන් වන නිසයි.

## ඩෙංගු -

ඩෙංගු වලින් මිය ගිය සංඛ්‍යාව 150ක් ඉක්මවා ගියත් ඒ ගැන බලධාරීන්ගේ ප්‍රතිචාර ගැන නම් කියලා වැඩක් නෑ. වසංගතයක් ලෙස පැතිරෙන රෝගයක් මර්ධනය කරන්න ආන්ඩුවෙ ඇති සියලුම සම්පත් යොදා ගෙන ඉලක්ක සහගත වැඩපිලිවෙලක් ක්ෂනිකව යෙදිය යුතු මොහොතක ඒ ප්‍රයෝගික වැඩපිලිවෙලට වඩා මාධ්‍ය හරහා ජනතාවට අනතුරු අඟවමින් තර්ජනය කරමින් දඬුවම් පමුනුවන්න උත්සහ දැරීම විකාරයක්. වසංගතයක් යනු ක්‍රමික වර්ධනයක අවසන් ප්‍රතිපලයයි. ජනතාවට පෙර දඬුවම් කල යුත්තේ ලෙඩක් ලෙස පැමිනි ඩෙංගු වසංගතයක් දක්වා වර්ධනය වන තුරු ක්‍රියාකාරී නොවූ සෞඛ්‍ය සේවයට හා එහි නිළධාරීන්ටයි. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සිට පහළම නිලධාරි දක්වා සේවයන්ගේ අඩුපාඩු ජනතාව පිට පටවා ඇඟ බේරාගැනීම නොකල යුත්තක්. ජනතාවටද යම් වගකීමක් ඇති නමුත් ඔවුනට මඟ පෙන්වීමේ වගකීම ඇත්තේ රජයට හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවටය. ඔවුන් කළ යුතුව ඇත්තේ වසංගතය පාලනය කිරීම සඳහා පලාත් පාලන ආයතන හා පරිසර අමාත්‍යංශද එක්කොට ඒකාබද්ද වැඩපිලිවෙලක් සැකසීම මිස අඩුපාඩු එකිනෙකා මත පවරමින්, දොස් කියමින් ජනතාවට දඬුවම් කිරීම සඳහා වන කඩා පනින හමුදාවක් ගොඩ නැගීම නොවේ. සෞඛ්‍ය ඇමති තුමාගේ ප්‍රකාශ දිහා බැලුවහම "ලෝකෙට පරකාසේ ගෙදරට මරගාතේ" මතක් වන්නේ ඉබේටම.

## මයිකල් ජැක්සන්

ලංකාවේ වගේම ලෝක මට්ටමෙනුත් වේදිකාවලට ගායක ගායිකාවෝ නළුවො ආදි කලා ශිල්පීන් අනන්තවත් එනවා යනවා ඒත් රසිකයින්ගේ හදවත් තුල සදා කල් රැඳී ඉන්න හැකි වන්නේ කී දෙනාටද ? නිරන්තරයෙන් නිර්මානය නොකලද කරන ලද ප්‍රමානය කුඩා වුවත් ජනතාවගේ ගෞරවයට පාත්‍රවන්නට කලාකරුවෙකුට හැකිවන්නට නම් ඔහුගේ ඇයගේ කිසියම් සුවිශේෂී .. තිබිය යුතුමයි. මයිකල් ජැක්සන් ද වැටිය යුත්තේ ඒ කොටසට බව අපේ හැඟීමයි. ජීවිත කාලය තුලම කිසිදා කලා පාසලකින් ගායනය හෝ නර්ථනය ශිල්පයක් ලෙස ඉගෙන නොගත්තද ලෝකය පුරා රසිකයින්ගේ ආදර ගෞරවයට පාත්‍රවීමට ඔහුට හැකි වූයේ කෙසේද? එය කිසියම් ප්‍රාතිහාරයක් හෝ දේව අනුහසක් නිසා සිදු වූවක් නොවේ තමන් තෝරා ගත් මාර්ගයේ නියම කැපවීමෙන් හා අධිෂ්ඨානයේ අග්‍ර ප්‍රථිලය ඔහුගේ සාර්ථකත්වයයි මයිකල් යුගයක් නිමා කල කලාකරුවකු වන්නේ ඒ නිසයි අද අපි බටහිර රිද්මය ගැන විවෘත කතා කලත් එදා අප බොහෝ දෙනෙකුට ඒ ගැන අදහස් පල කිරීමට විදියක් තිබුනේ නැහැ ඔහුගේ රිද්මය ඇඟට දැනෙන දෙයක් වුවත් නර්ථනය අපූර්ව නිර්මාන ශිලී වුවත් ඔහු අපට බෙරිහන් දෙන වේදිකාවේ එක්තරා නැට්ටුවෙක් පමනක් උනේත් අද නිවැරදිව ඔහු දෙස බලා නිසැක දක්ෂයෙක් නර්ථන ප්‍රවීනයෙක් ලෙස හැඳින්වීමට හැකි වන්නේත් මොන හේතුවක් නිසාද කියා තාම අපි කාටවත් නිශ්චිතව කියන්න පුළුවන්ද ? අප කොදෙව්වක ජීවත් වූ බවත් අපේ සංස්කෘතිය බැඳීම් හා සීමාවන් නිසත් නිවැරදි දේ දකින්නට බැරි වුනාය කෙනෙකුට තර්ක කල හැකිය ඒත් අපේ සංස්කෘතිය විසින් අපට අළුත් දේ ප්‍රතික්ෂේප කරන්නවත් දක්ෂයව කොන් කරන්නවත් කියා දී තිබේද ? මයිකල් ජැක්සන් වැනි කලා කරුවන් ගැන විවෘත කථා කරන අප හැමෝම පිලිතුරු යුතු ප්‍රශ්නයක් ඒක

## අන්තර්ජාල වැඩ කිඩ

යුද්ධය අවසන් වුන කාලවකවානුවෙත් ඊට පසු යුද්ධය හා LTTE ය අලලා අනතර්ජාගයේ තිබූ දර්ශනය බොහෝමයක් අප දැක්කා එහි තිබුන හැම දෙයක්ම අනුමත නොකලත් අප ඒවා බැලුවේ සමහර දේ තුල යම් නිර්මානත්මක බවක් තිබූ නිසය ඒත් ජයග්‍රහනයෙන් පසු එහි සීමාවක් නැතුව ගිහින් බාලම තත්වයට වැටිලා අප පරාජිතයින්ට තලා පෙලා නින්දා අපහස කරපු ජාතියක් නෙවේ එහෙත් පසුගිය දිනවල අන්තර්ජාලයට නිකුත් කර තිබූ LTTE කාන්තා කොටි බලකායේ සෙබලියන්ගේ නිරුවත් කර මරා දමා තිබු සිරුරු වග දර්ශන ගැන නම් එය දකින කාට වුවත් ඇති වන්නේ පිලිකුලක් සහ කෝපයක් ඒ දර්ශන අන්තර්ජාලයට නිකුත් කිරීම වීර කතාවක් ලෙස කිසි සේත්ම අනුමත කරන්න බැහැ මුළු ලෝකයම රජය විසින් LTTE ය පරාජය කර ඇති බව දන්නා මොහොතක කොටි සෙබලියන්ගේ නිරුවත් සිරුරු වල දර්ශන නිසා රජයේ හමුදා පත්වන්නේ දැඩි අසීරුවකට බව මේවා කරන එවුන්ට තේරෙන්නේ නැතිද ? එය හමුදාවත් රජයත් පිලිබඳව වැරද චිත්‍රයක් ලොව තුල මවන්නට KP ලට දෙන ලොකු උපකාරයක් බව කාටවත් තේරුනේ නැද්ද ? මේ දර්ශන පෙලේ ඇති KP ලගේ පැවතීම තහවුරු කරගන්න මොනතරම් උපකාර ලබාගන්න පුළුවන්ද ? කියලා මේ දුටුවහොත් ඔබට වුවත් වැටහේවි හැකිනම් හොයාගෙන බලන්න කනගාටු හිතෙන්නෙ උන් ගැන නොවේ අපි ගැනයි

සංක්‍රමණිකයා

GATEWAY
LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial
- Conveyancing - Sale or Purchase of Houses, Vacant Land, Units, Flats, Shops, Factories & Farms
- General, Medical or Enduring Powers of Attorney
- Wills & Estate Planning

Professional, Quality Service Assured

Senanie Kurukularatne LL.B, Grad Dip.LP
Barrister & Solicitor
Attorney -at- Law - Sri Lanka

Phone : 03 87869682
Fax : 03 87869681
Mobile : 0414 660 513
Email : gateway5@bigpond.net.au
17, Glenview Rise, Berwick, VIC 3806 Austraila

ඇඩ්වටයිස් in Sannasa
the best way to talk to the
Sri Lankan Community
Call Saamantha
- 0433 638 610

LA TROBE TAXATION SERVICES
14 day Tax Refund
INDIVIDUAL RETURNS $70
(Concession Rates for Students)
BUSINESS TAX RETURNS
(BAS / IAS)
La Trobe Taxation Services
BUNDOORA
Registered Tax Agent and Accountant
Contact
Mala : 9470 8241 or 0401 000 421
email : latrobetax@yahoo.com.au
